1990 සුවසැරිය පදනම - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සුවසැරිය පදනමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් නිර්දේශිත ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සඳහා නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සුවසැරිය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති රීති හා විධිවිධානවලට යොමුව			අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනත				
	(i)	පනතේ 7 (අ) (II) උප වගන්තිය	සෞඛ්‍යය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කළ යුතු වුවද 2024සැප්තැම්බර් සිට ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කරමින් මෙම ගැටලුව පිළිබඳ දැනුම් දීමක් සිදු කරන ලද බව හා මෙම ගැටලුව සඳහා හැකිතාක් ඉක්මනින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සාධනීය පිළිතුරක් ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වන බව.	පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.
	(ii)	පනතේ 18 (5) සහ 25 (1) උප වගන්ති	මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු අතර 25(1) උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන්ද රීති සකස් කරනු ලැබිය හැකිය.එසේ පදනම විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පනතේ 25 (1) වගන්තිය අනුව සකස් කළ හැකි රීති පිළිබඳ නීති උපදෙස් ලබාගෙන එම නීති උපදෙස් ප්‍රකාරව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජීවීකේ ඊඑම්ආර්අයි ලංකා (පුද්ගලික) සමාගම (GVK EMRI Lanka (Private) Ltd) ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) උප වගන්තිය		2024 දෙසැම්බර් 31 දිනට පදනමට ලැබිය යුතු ශේෂය රු.441,074,908 ක් වූ අතර ඉන් රු.352,591,526 ක් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු පුනරාවර්තන වියදම් විය. එම ශේෂය තුළ පවතින 2019 වර්ෂයේ සිට පැවත එන රු.330,091,526 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය	මෙම මුදල ලබා ගැනීමට පසුගිය වසර කීපයේම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය සියළු ලිපිගොනු හා ලිපි ලේඛන මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති බව, නමුත් මේ සඳහා මහා	භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම මුදල සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් ගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.

			විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර ශේෂ සනාථ කිරීමක්ද විගණනයට ඉදිරිපත් නොවුණි.	භාණ්ඩාගාරය කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නැති අතර එක් අවස්ථාවකදී පමණක් සාකච්ඡාවකට පැමිණෙන ලෙස වාචිකව දන්වා එම සාකච්ඡාවද පසුව අවලංගු කරන ලද බව හා මහා භාණ්ඩාගාරයෙන් පිළිතුරක් ලැබූ විගස ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත				
	(i)	38 (1) උප වගන්තියේ (ඇ) ඡේදය	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද ,ඒ අනුව කටයුතු කර නොතිබුණි .	සියලුම ගිණුම් කටයුතු, සියලුම මෙහෙයුම් කටයුතු සහ ගබඩාව සම්බන්ධ කාර්යයන් පරිගණක ගත පද්ධතියක් යොදා ගනිමින් සිදු කරනු ලබන බව, පදනම සතු කාර්යයන් බොහෝමයක් මේ ආකාරයෙන් විධිමත් පද්ධතීන් හරහා සිදු කරනු ලබන බැවින් සහ වරින් වර ඉහළ කළමනාකාරිත්වය මගින් එම පද්ධතීන්ගේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කරමින් අවශ්‍ය වන්නාවූ වෙනස් කිරීම් අභ්‍යන්තරිකව සලකා බැලීම සිදු කරන බව.	පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.
	(ii)	38 (2) උප වගන්තිය	පනතේ 38 (1) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ	අභ්‍යන්තරව පවත්වන්නා වූ කළමනාකරණ තීරණයන් විගණකාධිපති වෙත යොමු කිරීමක් සිදු කර නොමැති අතර	පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.

		අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ගනු ලබන එවන් ලිඛිත තීරණ වෙතොත්, ඒ පිළිබඳ විගණනය වෙත කරුණු ඉදිරිපත් කරන බව.	
(ඇ)	රාජ්‍ය ව්‍යාපාර හැසිරීම පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.6 ඡේදය	උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දී සේවකයා හා කළමනාකාරීත්වය අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රියාත්මක විය යුතුය. එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිලධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, පදනම විසින් නිලධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් සිදුකර නොතිබුණි. එසේම සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබූ නමුත් වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් දක්වා නොතිබුණි.	එකඟ වන බව, එනම් දැනට සිදු කරමින් යන්නා වූ ක්‍රියාවලියම තව දුරටත් ඉදිරියට ගෙනයමින් ලිඛිත ලේඛනයන්ද භාවිතයට ගනිමින් සේවක කාර්ය සාධන ඇගයීම සිදු කිරීමට ද බලාපොරොත්තු වන බව, විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් සකසා ගැනීමට අවශ්‍ය ඉදිරි පියවරයන්, අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් මත ඉදිරියට කරගෙනයාමට බලාපොරොත්තු වන බව.	නිලධාරීන් සඳහා ඵලදායී කාර්ය සාධන ඇගයුමක් සිදුකර සුදුසු වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කරගත යුතුය.
(ඉ)	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත			
	(i) 2 වන පරිච්ඡේදයේ 2.3 ඡේදය	පදනමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික අයවැය ලේඛනයද ඇතුළත් උපාය මාර්ගීක සැලැස්මක් සකස් කර එම සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ	මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සිදුකිරීමට අවශ්‍යව පවතින සියලු වෙනස්කම් ඉදිරියේදී සිදුකර සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම නැවත සකස් කර	චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.

			ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. අනුමත නොකරන ලද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළද එම සැලැස්ම මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	ඉදිරිපත් කරන බව.	
	(ii)	5 වන පරිච්ඡේදයේ 3 ඡේදය	අයවැයගත ආදායම් ප්‍රකාශයක්, අයවැයගත මූල්‍ය තත්ත්වය දක්වන වාර්තාවක්, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් හා ප්‍රාග්ධන වියදම් අයවැයක් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී ඇතුළත් කළ යුතු වුවද මාර්ගෝපදේශය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික අය වැය ලේඛනය සාදන විට මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අය වැය ගත මූල්‍ය තත්වයන් දක්වන ප්‍රකාශයන් සහ අය වැය ගත ආදායම් ප්‍රකාශයන් සකස් කිරීමට කටයුතු කර ඇති බව, 2025 වර්ෂයේ අය වැය ලේඛන සැකසීමේදී එම සියලු වාර්තා නිවැරදි ආකාරයට ඉදිරිපත් කරන බව.	චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.
(ඊ)		ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880	රජයේ මුදල්, බඩු බාහිරාදිය භාර ගැනීම හෝ බාරව සිටීම, එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් පදනමේ ඇප තැබිය යුතු නිලධාරින් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟවන අතර ඉදිරියේදී අදාළ ඇප මුදල් තබාගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 53,278,735 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 269,930,094 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.216,651,359 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පදනමේ මෙහෙයුම් ආදායම වර්ධනය වී තිබුණද එයට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයකින් මෙහෙයුම් වියදම් ඉහලයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය		කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පදනම විසින් කුලී පදනම මත සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙහි පළමු, දෙවන, තෙවන සහ පස්වන මහලේ කොටසක් පදනමේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන අතර ගෙවනු ලබන කුලී මුදල සඳහා තක්සේරු වාර්තාවන් ලබාගන්නා ලෙස 2024 මාර්තු 29 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව ලබාගන්නා ලද තක්සේරු වටිනාකම්වලට වඩා වැඩි වටිනාකමක් ක්‍රියාත්මක කරන ලද ගිවිසුම් අනුව එකඟ වී තිබුණු අතර මාස 12 ක ගිවිසුම්ගත කාලයක් සැලකීමේදී තක්සේරු වටිනාකම ඉක්මවා රු.මිලියන 05ක බදු වියදමක් සුවසැරිය පදනම දරා තිබුණි. තවදුරටත් ගොඩනැගිල්ලේ හිමිකරු රජයේ තක්සේරු වටිනාකමට එකඟතාවය පළකර නොතිබුණු අතර ගිවිසුම්ගත කුලී මුදලද ඉක්මවන වෙනත් තක්සේරු වාර්තාවක් හිමිකරු විසින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද ගොඩනැඟිල්ලේ කුලී වටිනාකම පිළිබඳව එකඟතාවයකින් තොරව හා වාර්තාවේ දින වන විට දෙපාර්ශවය අතර එළඹි ගිවිසුමක් නොමැතිව පදනම සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන බව විගණනයේදී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී	2025 මාර්තු මස 28 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත කරුණු දැක්වූ අතර එහිදී ලබා දුන් තීරණය මත මෙම ගොඩනැගිල්ලෙහි කුලිය සම්බන්ධව අනුමැතිය ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කිරීමට තීරණය කරන ලද අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලබාදෙන උපදෙස් මත ඉදිරි පියවර ගන්නා බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 835 (2) ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 835 (2) රෙගුලාසිය අනුව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී ආයතන ප්‍රධානියා ප්‍රධාන තක්සේරුකරු විමසිය යුතු වන අතර ප්‍රධාන තක්සේරුකරුගේ තීරණය බාර ගන්නට ප්‍රධානියාට නුපුළුවන් නම්, එම ගොඩනැගිල්ල කුලියට ගන්නා ආයතනය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත තීරණයක් සඳහා එම කාරණය යොමු කළ යුතු වුවද පදනම ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.		
(ආ)	ගිලන්රථ සඳහා නව ටයර් යෙදීමෙන් පසු භාවිතාකරන ලද ටයර් අපහරණය සඳහා නැවත ගෙන්වා ගබඩාකර තිබුණු අතර ඇතැම් ටයර් ඉතා අධික ලෙස ගෙවී තිබුණු බවත් ඇතැම් ටයර්වල කම්බි නිරාවරණය වී අනාරක්ෂිතව පැවති බවත් නිරීක්ෂණය වූයෙන් මෙය ආරක්ෂිත සායනික පරිසරයක් තුළ පූර්ව රෝහල් ප්‍රතිකාර ලබාදීමේදී සුදුසු නොවන තත්ත්වයක් විය. තවද මෙම ටයර් සත්‍ය වශයෙන්ම ගිලන්රථවලින් ඉවත්කරන ලද ටයර්මද යන්න ගණනයේදී බැහැරකල නොහැකි විය. එසේම 2023 හා 2024 වර්ෂයන් තුළ නව ටයර් 2299ක් ගිලන්රථ සඳහා නිකුත් කර තිබුණු අතර භාවිතයෙන් ඉවත්කරන ලද ටයර් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් එම කාල පරිච්ඡේදය තුළ භාවිතකරන ලද ටයර් 1068 ක් පමණක් නැවත පදනම වෙත බාරදී තිබුණි. 2022 වර්ෂයෙන් පසුව. මෙම ටයර් අපහරණය තුළින් ආදායමක් උපයා ගැනීමට පදනම විසින් කටයුතු කර නොතිබුණු අතර ඒවා විනාශකිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණි.	පදනම උත්සහ දරනුයේ ගිලන්රථයක් හැකි උපරිම අවස්ථාව දක්වාම මෙහෙයුම් කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීමට බව, එහිදී එම අනුමැතිය ප්‍රකාරව ගිවිසුමට අනුව අළ ආයතනය වෙත ටයර් ලබා දීම නිසි ආකාරව සිදුවන අතර ඒ හා සම්බන්ධ සියලුම වාර්තාවන් නියමිත පරිදි පවත්වාගෙන යන බව.	ගිලන්රථ සඳහා නව ටයර් යෙදීම, භාවිතාකරන ලද ටයර් අපහරණය සහ ගබඩාකිරීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 18 දරන සුවසැරිය පදනම් පනතේ 4 (ඇ) වගන්තිය ප්‍රකාරව තෑගි හෝ පරිත්‍යාග ලබාගැනීම සඳහා පදනමට බලතල හිමිව තිබුණද භාණ්ඩාගාර ලේකම්ගේ 2022 මාර්තු 30 දිනැති අංක FP/01/01/05/09-2022 දරන පදනමේ සභාපති අමතන ලද ලිපිය ප්‍රකාරව, පදනම වෙත ලැබෙන ත්‍යාග/ප්‍රධාන ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 2022 ජුලි 08 දිනැති අංක SA/MAA/GRG/01 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව පදනමට ලබාදෙන පරිත්‍යාග ප්‍රථමයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල ගිණුමට මාරුවනු පිණිස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව නියමිත අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ යුතු වුවත් 2024 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග මුදල් රු.22,042,231 ක් යථෝක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	රු. 22,042,231 ක් වූ චෙක්පත ලැබෙන ලද්දේ මහා භාණ්ඩාගාරය නමින් නොව 1990 සුව සැරිය පදනම නමට බව, එනම් ඇතැම් පරිත්‍යාගශීලීන් සතුව රටේ තත්ත්වය සහ එවකට රජයේ මූල්‍ය අංශය කෙරෙහි එතරම් විශ්වාසයක් නොතිබිම හේතුවෙන් ඔවුන් මහා භාණ්ඩාගාරය වෙත සෘජුවම මුදල් එවීම ප්‍රතික්ෂේප කරන ලද බව, එම නිසා ඒවා සෘජුවම අරමුදලට ලබා ගෙන බැංකු ගතකළ අතර නිසි පරිදි ගිණුම් තබා ඇති බව.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ආ)	සුවසැරිය පදනම විසින් ග්ලූකෝස් හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ විශේෂාංග සහිත වැටීම් හඳුනාගැනීම සඳහා පැළඳිය හැකි සංවේදකයක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ පුද්ගලික සමාගම හා හොංකොං හි ලියාපදිංචි	මෙවැනි ව්‍යාපෘතියක් කරගෙන යාමට ආසියානු සංවර්ධන බැංකුවට අවශ්‍ය වුව ද ඒ සඳහා පරිත්‍යාගශීලී ආයතනයක් හමු නොවුණ නිසා, එම අවස්ථාවේදී ද ඔවුන් පැවසුවේ රට තුළ පවතින ආර්ථික අර්බුදය විසඳුණු වහාම අදාළ ප්‍රදානයන් ලබා දිය හැකි බවයි. එම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා යම් කාලයක් ගතවන අතර ඒ	සැළසුම් කරන ලද කාලය තුළදී ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

සීඅයිආර්කිව් ටෙක්නොලජීස් (CIRQ Technologies) ආයතනය සමඟ ගිවිසුම්ගතවී තිබුණි. මෙම ව්‍යාපෘතිය වැටීම් හඳුනාගැනීමේ සංවේදක මෘදුකාංගය නිර්මාණය කිරීම, ශරීරයේ ග්ලූකෝස් මට්ටම හා ලැක්ටේට් මට්ටම හඳුනාගැනීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා උපකරණය හා වැටීම් හඳුනාගැනීම් සංවේදක යන දෙකම ඇතුළත් කර පැළඳිය හැකි උපකරණයක් සංවර්ධනය කිරීම යනුවෙන් අදියර 3 කින් සමන්විත විය. පදනම රු.6,601,850 ක් වැයකර සංවේදක මෘදුකාංගය නිර්මාණය කර වර්ෂ 2ක් ඉක්මවා තිබුණද අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වීම තුළ මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණු බැවින් එය නිශ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	පිළිබඳව කරුණු සියල්ල පසු ගිය කාල වකවානුවල පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී ද නිරන්තර සාකච්ඡාවට බඳුන් කරන ලද බව, අදාළ පිරිවිතරයන් සපුරාලන ආකාරයේ පරිත්‍යාගශීලියෙකු හමුවූ වහාම මෙම සමස්ථ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හැකි වන බව.	

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ සමාලෝචිත වර්ෂය සඳහා පමණක් වූ අතර එය තුළ ද ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදන පිළිබඳව සඳහන් කර නොතිබුණි.	වර්තමානය වන විටද අනුමත කරන ලද අය වැය සම්පූර්ණ වශයෙන්ම ලබාදීමක් මහා භාණ්ඩාගාරය මගින් සිදු නොවන බැවින් සැලසුම් කිරීම ප්‍රායෝගික නොවන බව, එවැනි තත්වයක් යටතේ වසර 03 කට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ නොහැකි බව, ප්‍රසම්පාදන සැලැස්ම හා කාලසටහන් පිළියෙල කරන ලද්දේ ද ඉතා අසීරු තත්වයක් යටතේ බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය.
(ආ) පදනම විසින් 2023 වර්ෂයේදී ජංගම දුරකථන 200 ක් මිලදී ගැනීමට වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය යොදාගනිමින් ප්‍රසම්පාදන	අදාළ ලංසු විවෘත වෙලාව වන විට ලංසු ඉදිරිපත් කරන ලද්දේ ඇරයුම් කරන ලද සැපයුම්කරුවන්ගෙන් එක් අයෙකු පමණක් බව, මෙහිදී පිරිවිතර සකසා	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අවම පිරිවැයකින්

කටයුතු ආරම්භකර තිබුණි. මේ සඳහා ආයතන 03 කින් මිල ගණන් කැඳවූ බවත් එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු මිල ගණන් ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කළද ආයතන 03කින් වෙළඳපල මිල කැඳවුම් සිදු කළ ආකාරය පිළිබඳව විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි. එසේම විවිධ මිලගණන් යටතේ විවිධ මාදිලි සහිත පුළුල් ජංගම දුරකථන වෙළඳපල තුළ සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් පැවතියදී එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු මිල ඉදිරිපත් කිරීමත්, සන්සංදනයකින් තොරව එම තනි ලංසුව පමණක් සැළකිල්ලට ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී රු.10,472,500 ක් වූ මිලකට පදනම විසින් මෙම ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. එබැවින් අවම පිරිවැයකින් ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීම කෙරෙහි පදනම අවධානය යොමුකර නොතිබුණි.	ඇත්තේ විශේෂයෙන්ම ආයතනික අවශ්‍යතාවය සහ එහි අවශ්‍යයෙන් ම තිබිය යුතු අංග සහ ගුණාංග ඇතුළත් කරමින් බව, එබැවින් මෙහිදී එක් සැපයුම්කරුවකු පමණක් ලංසු ඉදිරිපත් කළ ද, එය තාක්ෂණික කමිටු වාර්තාව අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණු බැවින් සහ මෙහිදී වෙළඳපල මිල සැදැහුම ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණු බැවින්ද එම තාක්ෂණික කමිටු වාර්තාව අනුව තේරී පත්වූ සැපයුම්කරුට අදාළ ඇණවුම ලබා දුන් බව.	ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1152 ක් වූයෙන් කාර්ය මණ්ඩල ඌනතාවය 840 ක් විය. තවද අනුමත තනතුරු 42 න් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු 10 ට අදාළ කාර්ය මණ්ඩලය 24 ක් විය. ඒ අතරින් අනුමත පළාත් භාර නිලධාරීන් සහ තත්ත්ව විශ්ලේෂක තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 9ක් හා 5ක් වූ අතර එම තනතුරු පිළිවෙලින් 2018 සහ 2022 වර්ෂවල සිට පුරප්පාඩුව පැවතිණි. එසේම සහකාර සැපයුම් දාම කළමණාකරු තනතුරද 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතිණි.	මෙම පුරප්පාඩුව පවතින්නා වූ තනතුරු සඳහා වරින් වර අයදුම්පත් කැඳවුව ද, එම එක් අවස්ථාවකදීවත් එම තනතුරු පුරවාගත නොහැකි වූ බව, මෙහිදී එම තනතුරු පුරවාගැනීම නොහැකිවීමට ප්‍රධානතම හේතුව වූයේ සම්මුඛ සාකච්ඡා මගින් තේරීපත්වන සියලුම අයදුම්කරුවන්, අනුමත වැටුප් කාණ්ඩයට වැඩි වැටුපක් බලාපොරොත්තු වීම බව, පුරප්පාඩු තනතුරු සඳහා මේ වනවිටත් නැවතත් වරක් අයදුම්පත් කැඳවා අදාල සම්මුඛ පරීක්ෂණ සිදු කරමින් පවතින අතර ඉතාමත් ඉක්මනින් එම තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමට හැකිවන බව.	අත්‍යවශ්‍ය සේවකයින් බඳවා ගැනීමටත්, අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කර අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) උප වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයෙහි අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා එම අස්ථිත්වයෙහි පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවත් පදනම ආරම්භයේ සිට මේ දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.	මේ සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත වරින් වර දැන්වුවද අදාළ අනුමැතිය ලබා නොදුන් බව.	පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය.